# මොඩියුල අංක 06

# ඉගෙනුම්ලාභියා හඳුනාගැනීම

# Identifying the Learner

e-Learning by TEA
Teacher Education Administration Branch

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

## අරමුණු

- විවිධ වයස් කාණ්ඩවලට අයත් ඉගනුම් ලාභීන්ගේ ගති ලක්ෂණ හඳුනා ගැනීම
- ළමයා හා පරිසරය, ළමා සංවර්ධන අවශ්‍යතා, අධ්‍යයනය කරමින් ළමා චර්යාවන් හඳුනා ගැනීමේ ක්‍රමවේද භාවිත කිරීම
- පන්ති කාමරය තුළ සිසුන්ගෙන් මතුවන අභියෝගාත්මක චර්යාමය ගැටලු කළමනාකරණය කිරීම

## ඉගෙනුම් පල

- ගුරුවරයාට පන්ති කාමරයේ දී හමුවන සිසුන් චර්යාමය විවිධතා අනුව වර්ගීකරණය කරයි
- එම සිසුන්ගේ විවිධතා වලට ගැලපෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස මෙහෙයවයි

## පෙළගැස්ම

- ශිෂ්‍යයා හඳුනා ගැනීමේ වැදගත්කම
- ඉගෙනුම්ලාභියකු සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍ර
- බුද්ධි වර්ධනය


e-Learning by TEA
Teacher Education Administration Branch

## ශිෂ්‍යයා හඳුනා ගැනීමේ වැදගත්කම

ඔබට හමුවන ඉගනුම්ලාභියාව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට එකතු කර ගැනීමට පෙර ඔහුව මැනවින් හඳුනා ගත යුතුය එය තහවුරු කරන පහත ප්‍රකාශය බලන්න

"ජෝන්ට ලතින් ඉගැන්වීමට පෙර ලතින් ගැන පමණක් නොව ජෝන් ගැන ද දැන ගත යුතුය"
- (සර් ජෝන් ඇඩම්ස්)

ඒ අනුව ශිෂ්‍යයකු හඳුනා ගැනීමේ වැදගත්කම සටහන ඇසුරින් පැහැදිළි කරගත හැකිය




ශිෂ්‍යයකු මැනවින් හඳුනා ගැනීමේ වැදගත්කම අවධාරනය කෙරෙන පහත අවස්ථාවන් ද අධ්‍යයනය කරන්න

- ළමා අයිතිවාසිකම් කෙරෙහි වැඩි අවධානයක් පැවතීම එක්සත් ජාතීන්ගේ සංවිධානය 1959 සම්මත කළ ප්‍රකාශනය මගින් ළමයාට අඩු තරමින් ප්‍රාථමික අධ්‍යාපනය හෝ ලබා දිය යුතු බවට සම්මත වීම
  Link 1 (එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය)

*ආශ්‍රිත ග්‍රන්ථ*

*ගුණසේකර, සමරසිංහ. (1955) ළමා අයිතිවාසිකම්වලට බලපාන නීතිය මහරගම ජාතික අධ්‍යාපන ආයතනය*

- සම අධ්‍යාපන අවස්ථා ලබා දීමෙන් තනිව තීරණ ගැනීමට සමාජ වගකීම් වර්ධනයට හා සමාජයට අවශ්‍ය පුද්ගලයකු වීමට ඉඩ සැලසීම
- 1979 විශ්ව ළමා වර්ෂය ලෙසට නම් කිරීම
  Link 2 (විශ්ව ළමා වර්ෂය ප්‍රකාශයට පත්කිරීමට අදාළ ලේඛණය)

**වැඩිදුර තොරතුරු**

https://www.unicef.org/about/history/files/Child-Nation-M-Black-Ch15-p353-377-year-or-child.pdf


- 1998 යුනෙස්කෝ වාර්තාවෙන් ළමයාට ලබාදුන් සුවිශේෂී ස්ථානය
  Link 3 (1998 යුනෙස්කෝ වා්රතාවේ අදාළ කොටස)

- 1972 සැමට අධ්‍යාපනය සංකල්පය මත ළමා අභිරුචීන්ට ගැලපෙන ලෙසට ඉගෙනීමේ නිරත කරවීමට ප්‍රයත්න දැරීම
  Link 4 (1972 Education for all report)

## ඉගෙනුම්ලාභියකු සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍ර

ඉගෙනුම් ලාභියකුගේ විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳව විවිධ මනෝ විද්‍යාඥයින් විවිධ මතයන් පළ කර ඇත ඒවායින් මූලික ක්ෂේත්‍රයන් කිහිපයක් පහතින් දක්වමු එම කරුණුවලට අදාල මනෝ විද්‍යාඥ මත සටහනේ යොමුවලට පිවිසීමෙන් (link 5,6,7,8) තව දුරටත් ඔබට අධ්‍යයනය කළ හැක

1* ළමා අවශ්‍යතා
2* ඉගනුම්ලාභියාගේ පෞරුෂ වර්ධනය හා ලිංගික වර්ධනය.
3* බුද්ධි වර්ධනය
  3.1 ජීන් පියාජේ ඉදිරිපත්කළ බුද්ධි සංවර්ධන න්‍යායය
  3.2 හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධිය (සුහුරුබව) පිළිබඳ න්‍යාය.




Link 6

## 1.0 ළමා අවශ්‍යතා

මුලින්ම, "ළමා අවශ්‍යතා" ක්ෂේත්‍රය යටතේ ඒබ්‍රහම් මාස්ලෝ ඉදිරිපත් කර ඇති මතයට අනුව ඔබට හමුවන ඉගනුම්ලාභියකු පිළිබඳව පහත ක්ෂේත්‍ර ඔස්සේ අධ්‍යයනය කිරීමට සැලකිලිමත් වන්න ඔහු හා සාකච්ඡා කිරීමෙන්, ඔහුගේ චර්යාවන් නිරීක්ෂණය කිරීමෙන්, ඔහු පිළිබඳව ලියැවී ඇති වාර්තා අධ්‍යයනය කිරීමෙන් ඔබට පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගත හැකිය.

--------------------------------------

*(ලකුණු එකතුව ස්වයංක්‍රීයව ලැබෙන ආකාරයට google form එකක් හරහා ලබා දෙන්න)*

අසා ඇති ප්‍රශ්න සඳහා පහත පරිමාණයට අනුව ලකුණක් පිරිනැමීමට උත්සාහ කරන්න

| ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | නරකයි | ඉතා නරකයි |
|---|---|---|---|---|
| 5 | 4 | 3 | 2 | 1 |

1.0

1.1 ඉගනුම් ලාභියාට අවශ්‍ය ප්‍රමාණයට ආහාර, ජලය වැනි මූලික අවශ්‍යතා සපිරෙන්නේදැයි ඔබට හඳුනා ගත හැකි ද?

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

1.2 ඔහුගේ වාසස්ථානය කුමන ආකාරය ද?
(ස්ථිර, තාවකාලික, පැල්පත් නිවාස .... ආදී වශයෙන් එම නිවස වෙන් කර හඳුනා ගත හැකි ද?)

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

e-Learning by TEA
Teacher Education Administration Branch

2.0 ඔහුගේ ජීවන තත්ත්වය සුරක්ෂිත බව ඔබට දැනෙන්නේ ද? ඔහු හැම විටම කිසියම් බියකින් /කාංසාමය තත්ත්වයකින් පෙළෙන බව ඔබට දැනෙනවා ද?

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

3.0 ඔහුගේ පවුලේ සාමාජිකයන්ගෙන් හා ඔහු ඇසුරුකරන්නන්ගෙන් ඔහුට නිසි ආදරයක් පිළිගැනීමක් ලැබෙන බව ඔබට හැගෙන්නේ ද?

4.0 ඔහුගේ වැඩිහිටියන් හා පවුලේ සාමාජිකයින් සහ ඔහු අතර මනා බැඳීමක් පවතින බව ඔබට දැනෙන්නේ ද?

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

------------------------------------------

5.0

5.1 ඔහුගේ අදහස් අන්‍යන්ගේ පිළිගැනීමට ලක්වන බව ඔබට හැගෙනවාද?

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

5.2 ඔහුගේ චර්යාවන්ට,ක්‍රියාවන්ට අන්‍යයන් වෙතින් ප්‍රශංසා,දිරිගැන්වීම් ලැබේද?

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

6.0

6.1 ඔහු කිසියම් පිළිවෙලක් සහිතව,විධිමත්ව යම් ක්‍රියාවක නිරතවීමේ හැකියාවෙන් යුක්තද?

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

6.2 බැලූ පමණින්ම ඔහු "පිළිවෙලට වැඩ කරන තෘප්තිමත් චරිතයක්"යැයි ඔබට හැඟේද?

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

7.0 ඔහුගේ පන්තියට අදාළ නිසි ප්‍රවීනතාවන්ගෙන් ඔහු සමන්විත ද?තව දුරටත් සමාජයේ පිළිගැනීමට ලක්වීමේ අවශ්‍යතාවෙන් ඔහු පෙළෙන බව ඔබට දැනේද?

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|

ලැබූ මුලු ලකුණු සංඛ්‍යාව ( 50න් ) | |

-------------------------------------------

**ඔබට ලැබුණු මුලු ලකුණු සංඛ්‍යාව**

ලකුණු 46-50 අතර නම් - එම ශිෂ්‍යයා ළමා අවශ්‍යතාවන් හොඳින් සපිරෙන අයෙකි ඔහුට දැන් අවශ්‍යවන්නේ තව දුරටත් පුළුල් අත්දැකීම් ග්‍රහණය කරගෙන සමාජ සම්මානනයට පාත්‍රවීමේ අවශ්‍යතාවයයි.

ලකුණු 41-45 අතර නම් - ඉහත අවශ්‍යතාවන් ඔහුව හොඳින් සැපිරී නැත ඔබ ඒ පිළිබඳව සැලකිලිමත් වී ඔහුගේ අවශ්‍යතා පූරණය කර ගැනීමට උදව් කළ යුතුය

ලකුණු 36-40 අතර නම් - ඔහු පිළිවෙලට වැඩ කරන තෘප්තිමත් ශිෂ්‍යයෙකි

ලකුණු 31-35 අතර නම් - එම තත්ත්වයට ඒමට උත්සාහ කරන අයෙකි. ඔබ ඔහුට ඒ සඳහා උදව් කළ යුතුය

ලකුණු 26-30 අතර නම් - ඉහත අවශ්‍යතාවලින් ඔහු බොහෝ දුරට සම්පුර්ණ වී ඇත

ලකුණු 20-25 අතරනම් - ඔහු ගුරු දෙමාපිය ආදරය අපේක්ෂා කරයි. ඔහුට නිවසෙන්/ පාසලේන් නිසි පිළිගැනීමක් නොලැබේ. ආරක්ෂා වීමේ අවශ්‍යතාව ඔහුට දැනෙයි

ලකුණු 11-19 අතර නම් - වාසයට සුදුසු ස්ථානයක ඔහු නොවසයි.ඔහුට නිසි වාසස්ථානයක් ලබා ගැනීමට ඔබට මොනතරම් දුරට මැදිහත්විය හැකිදැයි සොයා බැලීම වටනේය.

ලකුණු 1-10 අතර නම් - ඔහුට කිසිදු මූලික අවශ්‍යතාවක් ප්‍රමාණවත්ලෙස සැපිරෙන බවක් නොපෙනේ. ආහාර, ජලය ඔහුට ප්‍රමාණවත් ලෙස නොසැපයේ.

-----------------------------------

ඒබ්‍රහම් මාස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද "අවශ්‍යතා ධූරාවලියට" අනුව ඔබේ ශිෂ්‍යයා දැනට සිටින ස්ථානය පිළිබඳ යම් අවබෝධයක් ඔබ ලබා ගන්නට ඇතැයි සිතමු.

ඔහුගේ ලකුණු අඩු වූ ක්ෂේත්‍ර පුනරුත්ථාපනය සඳහා ඔබට යම් මැදිහත්වීමක් සිදු කළ හැකිදැයි සොයා බලන්න. එමගින් සෑම ගුරුවරයකු ලෙස අත්විඳිය හැකි තෘප්තිමත් බව අත්විඳින්න.

ඔබේ ඉගනුම්ලාභියාගේ පෞරුෂ හා ලිංගික වර්ධනය පවත්නා තත්ත්වය පිළිබඳව දැන් අපි කරුණු සොයා බැලීමට උත්සාහ කරමු.

-------------------------------

## 2.0 ඉගනුම්ලාභියාගේ පෞරුෂ වර්ධනය හා ලිංගික වර්ධනය.

සිග්මන් ප්‍රොයිඩ්ට අනුව ඔබට හමුවූ ඉගනුම් ලාභියා අවු 5 පසුවන විට පූර්ව ලිංගික අවධිය පසු කර මේ වන විට ගුප්ත ලිංගික අවධියේ හෝ වෘද්ධ ලංගික අවධියේ පසුවෙයි.

ඉගනුම් ලාභියාගේ මූලික අවශ්‍යතාවන් පිළිබඳව අවබෝධ කර ගත් ඔබ දැන් සූදානම් වන්නේ ඔහුගේ පෞරුෂ හා ලිංගික වර්ධනය පිළිබඳව සොයා බැලීමටයි.

1. ප්‍රොයිඩ්ගේ වර්ගීකරණයට අනුව ඔහු පසුවන අවධිය හඳුනා ගන්න.
2. ඔහුගේ චර්යා හොඳින් නිරීක්ෂණය කරන්න. පාසල් ක්‍රීඩා පිටිය,ආපන ශාලාව,පන්ති කාමරය,ශිෂ්‍ය සමිති පැවැත්වෙන අවස්ථා, සිසුන් නිදහසේ සිටින අවස්ථා මේ සඳහා උපයෝගී කර ගන්න.
3. ඔහුගේ සුවිශේෂී පෞරුෂ ලක්ෂණ ඔබට හඳුනා ගත හැකිද? ඒවා ලියන්න.
4. එම පෞරුෂ ලක්ෂණ ඔහුගේ පූර්ව ලිංගික අවධියේ දී අවරෝධනය කර ගත් ආශාවන් නිසා ඇති වූ ඉච්චාභංගත්වයත් යටි සිතේ තැන්පත් වූ එම තත්ත්වයන් මැඩ පැවැත්වීමට මතු වූ පෞරුෂ ගති ලක්ෂණ ලෙසත් ඔබට හඳුනා ගත හැකිද? එම සුවිශේෂී පෞරුෂ ලක්ෂණ ලියන්න.
5. උපායශීලි ක්‍රමවේද භාවිතයෙන් ඉගනුම්ලාභියාට හානියක් නොවන ආකාරයට එලෙස අවරෝධනය කරගත් ආශාවන් මොනවාදැයි ඔබට හඳුනා ගත හැකිද?

6. ඉගනුම්ලාභියා හානිකර පෞරුෂ ලක්ෂණ පෙන්වන්නේ නම් එම තත්ත්වය මග හැරවීම සඳහා ඔබට කල හැකි දේ අනුපිළිවෙලින් ලියන්න.

දැන් ඔබ ඔබට හමුවූ ඉගනුම් ලාභියාගේ මූලික අවශ්‍යතා ඉටු වීම පිළිබඳවත් ඔහුගේ පෞරුෂ හා ලිංගික වර්ධනය සිදුවන ආකාරය පිළිබඳවත් යම් අවබෝධයක් ලබාගන ඇතැයි සිතමු.

මී ළඟට ඔබ උත්සාහ කරන්නේ ඔහුගේ බුද්ධි වර්ධනය සිදුවන ආකාරය පිළිබඳව සරලව සොයා බැලීමටය.

## 3.0 බුද්ධි වර්ධනය

### 3.1 ජීන් පියාජේ ඉදිරිපත්කළ බුද්ධි සංවර්ධන න්‍යායය

පළමුව ජින් පියාගේ මතයට අනුව ඔබේ ශිෂ්‍යයා හඳුනා ගැනීමට උත්සාහ කරමු. පියාජේ ඉදිරිපත් කළ බුද්ධි සංවර්ධන අවධින් 4 නැවත සිහිපත් කර ගන්න.

1. ඉන්ද්‍රීය චාලක අවධිය (උපතේ සිට අවු 2 දක්වා)

2. පූර්ව ක්‍රියාකාරී චින්තන අවධිය (අවු 2-7)

3. සංයුක්ත චින්තන අවධිය (අවු 7-11)

4. විධිමත් චින්තන අවධිය (අවු 12 සිට නව යොවුන්විය දක්වා)

--------------------------------------

1. ඔබේ ශිෂ්‍යයා ඔහුගේ ජන්ම වයස අනුව අයත් වන්නේ කුමන අවධියට ද?

2. ඔහුගේ සැබෑ ක්‍රියාකාරිත්වය එම අවධියේ දී සම්මත චර්යාවන් හා ගැලපේද? ඔබට එය ප්‍රතිශතයකින් දැක්විය හැකිද?

3. ඔහුගේ වර්තමාන තත්ත්වය අනුව ඔහුට ගැලපෙන ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැළසුම් කිරීමේ දී ඔබ කුමන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුද?

පුද්ගලයින් සතුව ඇති විවිධ ඉගනුම් ශෛලීන් පිළිබඳවත් එම ශෛලීන්ට ගැලපෙන ලෙස ඉගැන්වීම් ශෛලීන් යොදාගැනීම පිළිබඳවත් බහුවිධ බුද්ධිය/ සුහුරුබව පිළිබඳ න්‍යායයෙන් අපට දැනගත හැකිය.

### 3.2 හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධිය (සුහුරුබව) පිළිබඳ න්‍යාය.

ශිෂ්‍යයාගේ ඉගනුම් ශෛලියට ගැලපෙන ලෙස පන්තිකාමර ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුවන්නේ නම් එය ශිෂ්‍යයාට වඩාත් හොඳින් ග්‍රහනය කරගත හැකි බව හොවාර්ඩ් ගාඩ්නර්(1984) ඉදිරිපත් කළ බහුවිධ බුද්ධිය පිළිබඳ න්‍යායයෙන් (Theory of Multiple Intelligence) කියවේ. එය තවදුරටත් සංවර්ධනය වී මේ වනවිට බහුවිධ සුහුරුබව (Multiple smartness) පිළිබඳ සංකල්පය අවධාරණය කෙරේ

1. ඉදිරිපත් කර ඇති ලේඛණය අධ්‍යයනය කිරීමෙන් හා එහි දැක්වෙන පරිදි විවිධ ප්‍රශ්න වලට ඔහු පිළිතුරු ලබාදෙන ආකාරය අනුව ඔබේ ශිෂ්‍යයාට වැඩිපුරම ඇත්තේ කුමන සුහුරුබව දැයි හඳුනා ගන්න.

2. එම සුහුරුබවට ගැලපෙන ලෙස ඉගනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැළසුම් කිරීමේ දී ඔබ වැඩිපුරම සැළකිලිමත් විය යුත්තේ කවර කරුණු කෙරෙහි ද?

4. මේ ආකාරයට ඔබේ පන්තියේ සියලු සිසුන්ගේ ප්‍රමුඛවන සුහුරුභාවයන් ලැයිස්තුගත කරන්න

5. ඒ අනුව පහත ක්‍රියාකාරකමෙහි නිරතවීමට උත්සුකවන්න

3. ඔබ කැමති මාතෘකාවකට අදාළව වි. 40 ක පාඩමක් ඉගැන්වීමට ඔබට සිදුවේ යැයි සිතන්න. ඔබේ සිසුන්ට ගැලපෙන ලෙස හා ඔවුන්ගේ බහුවිධ සුහුරුභාවයන් වර්ධනය වන ආකාරයට පාඩම් සැළසුමක් සකසන්න

4. දැන් ඔබ සැළසුම්කළ පාඩම සිසුන් සමග ක්‍රියාත්මක කරන්න.

සිසුන්ගේ බහුවිධ සුහුරුභාවයන් වර්ධනයවන ආකාරයට ඔබ ඉගැන්වූ පාඩම සිසුන්ට වඩාත් ' දැනෙන අයුරින් ' වඩාත් 'ඵලදායීලෙස' ඉගැන්වීමට හැකිවූයේයැයි දැන් ඔබට සිතෙන්නේද?

එසේ නම් ඔබේ සෑම ඉගනුම් ලාභියකුගේම සෑම සුහුරුභාවයක්ම පවතින තත්වය නිවැරදිව හඳුනාගෙන ඔවුන්ගේ සෑම සුහුරුභාවයක්ම වර්ධනය කළහැකිවන පරිදි විවිධ ක්‍රියාකාරකම්වලට ඔවුන්ව සම්බන්ධ කරගන්න.

---------------------------------------

දැන් ඔබ පහත දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර 03 ක් ඔස්සේ ඔබ හමුවට පැමිණි ශිෂ්‍යයා මැනවින් හඳුනාගන ඇත.

1. ළමා අවශ්‍යතා
2. ඉගනුම්ලාභියාගේ පෞරුෂ වර්ධනය හා ලිංගික වර්ධනය.
3 බුද්ධි වර්ධනය

e-Learning by TEA
Teacher Education Administration Branch

ඔහු තව දුරටත් සාර්ථක හා කාර්යක්ෂම ඉගනුම් ලාභියකු බවට පත්කරලීම උදෙසා සමස්තයක් වශයෙන් ඔබට අනුගමනය කළ හැකි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ඔබට යම් අදහසක් ඇතැයි සිතමු.

ඒ අනුව ඔබ පන්ති කාමරයේ සිසුන් සැමදෙනකුගේම සෑම සුහුරුභාවයක්ම වර්ධනය කිරීම සඳහා ගැලපෙන ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශයන් සෑම විටම යොදාගැනීමට සැළසුම් කරන්න

මේ වන විට අධ්‍යාපන මනෝවිද්‍යාඥයින් සිවු දෙනකු ඉදිරිපත් කරන ලද මතයන් පිළිබඳව හොඳින් අධ්‍යයනය කර ඉගනුම්ලාභියකු නිවැරදිව හඳුනාගැනීම පිළිබඳව අත්දැකීමක් ලබා ඇත.

එම අත්දැකීම් ඔස්සේ ඔබේ පන්ති කාමරයේ සිසුන් සියලු දෙනාම අධ්‍යාපන විද්‍යාත්මකව නිවැරදිව හඳුනා ගැනීමට උතිසාහ කරන්න.

හැමවිටම සිසුන්ට ඉගැන්වීමට පෙර ඔවුන් මැනවින් හඳුනාගන ඔවුන්ගේ ඉගෙනුම් ශෛලියට ගැලපෙන ඉගැන්වීම් ශෛලියක් යොදාගැනීමට උත්සාහ කරන්න

එවිට ශිෂ්‍ය සංවර්ධනය වඩාත් හොඳින් සිදුවන පරිදි සුතත්‍ය ක්‍රමවේදයන් (Othentic Methods) යොදාගනිමින් වඩාත් හොඳින් ශිෂ්‍ය සංවර්ධනය සිදුකිරීමට ඔබට හැකිවනු ඇත

එය ඔබව සැබෑ ගුරුවෘත්තිකයකු බවට පත්කරලීම සඳහා බෙහෙවින් ඉවහල් වනු ඇත

ආශ්‍රිත ග්‍රන්ථ

ගුණසේකර, සමරසිංහ. (1955) ළමා අයිතිවාසිකම්වලට බලපාන නීතිය මහරගම ජාතික අධ්‍යාපන ආයතනය

e-Learning by TEA
Teacher Education Administration Branch